**ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.1(ඇ)(i) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදුකර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1. 6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණවල ශේෂය රු.1,650,463,014ක් ලෙස දක්වා තිබූ නමුත්, 2023 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.1,616,420,732ක් වූයෙන් රු.34,042,282ක නොසැසඳීමක් පැවතුණි. | මෙය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන භාණ්ඩගාර යේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ආ යුතු අතර, ගැලපීම් සිදුකර ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම රු.1,653,419,211ක් ලෙස දක්වා තිබූ නමුත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වලට අනුව එම වටිනාකම රු.1,635,078,525ක් වූයෙන් රු.18,340,686ක නොසැසඳීමක් පැවතුණි. | මේ පිළිබඳව භාණ්ඩාගාරයට සිදුකළ දැනුම් දීමට අනුව එම දෝෂය 2024 වර්ෂයේ නිවැරදි කරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අපට දැනුම් දී තිබුණි. මෙයට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව. | භාණ්ඩාගාරය සමඟ සැසඳීම් සිදුකර ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කඩා ඉවත් කළ වර්ග අඩි 2,670ක ගොඩනැගිල්ලෙහි පිරිවැය මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තක්සේරු වාර්තා ලැබූ විගස එම ගොඩනැගිල්ලෙහි වටිනාකම CIGAS වැඩසටහනින් ඉවත් කරන බව. | ඉවත් කරන ලද මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 02ක ඇතුළු වීමේ දොරටු සහ නිවාස දොරවල් කඩා සොරකම් සිදුවී තිබූ නමුත් මේ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම නිවාසවල සොරකම් සිදුවීම සම්බන්ධයෙන් දැනගැනීමට ලැබුණු විගස වවුනියාව පොලිස් ස්ථානයේ පැමිණිලි ඉදිරිපත් කර පාඩු පිළිබඳව දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, කටයුතු කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම අත්කර නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන ප්‍රවර්ධන වැඩසටහන යටතේ පෙරියකට්ටු ග්‍රාම සේවක කොට්ඨාශයේ බඩඉරිඟු සහ රටකජු වගා කිරීම සඳහා එකතුව රු.645,000ක් වැයකර තිබූ නමුත් ඒවා සම්පූර්ණයෙන්ම විනාශ වීමෙන් මේ සඳහා වැයකළ මුළු මුදලම නිෂ්ඵල වියදමක් විය. | මෙම කාලපරිච්ඡේදය පසුගිය වර්ෂය සමග සැසඳීමේදී, වර්ෂාව අධිකව පැවැතුණි. රටකජු වගාව සඳහා ලබාදුන් බීජවලින් විශාල ප්‍රමාණයක් රෝපණ තත්ත්වයෙන් පැවැතියද වගාව වර්ෂාව හේ තුවෙන් විනාශයට පත්වූ බව. | විධිමත් අධ්‍යයනය කිරීමකින් පසු කාලීනව වගා කළ යුතු බෝග තෝරාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන ප්‍රවර්ධන වැඩසටහන යටතේ පෙරියකට්ටු ග්‍රාම සේවක කොට්ඨාශයේ එළුවන් ඇති කිරීමේ වැඩසටහන යටතේ එළුවන් 96ක් ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණි. ඉන් එළුවන් 22ක් මියගොස් තිබූ අතර මියයාමට හේතු හොයා බලා ඒ සඳහා තාක්ෂණික විසඳුම් ලබා දීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි. | අධික වර්ෂාව, සීතල සහ පණු රෝගවල බලපෑම හේතුවෙන්ද එළුවන් මියයෑමේ ප්‍රතිශතය වැඩි වී තිබුණි. එසේම, මෙම එළුවන් පට්ටිවල කුඩුකර ඇති කිරීමෙන් නිදැල්ලේ යෑමට සැලැස්වූ අවස්ථාවේ තෘණ අඩු වීම, කාලගුණ විපර්යාසයන් හේතුවෙන් මියයෑමේ සංඛ්‍යාව වැඩිවී තිබූ බව. | සත්ත්ව පාලනයට අදාල විශේෂඥ සහාය ඇතිව පිරිවිතර සකසා විධිමත් කොන්දේසි යටතේ එළුවන් මිලදී ගැනීමටත් පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන ප්‍රවර්ධන වැඩසටහන යටතේ පෙරියකට්ටු ග්‍රාම සේවක කොට්ඨාශයේ වානිජ පදනමින් කුකුළන් ඇති කිරීමේ වැඩසටහන යටතේ කුකුල් පැටව් 2,840ක් ලබා දී තිබූ නමුත් ඉන් කුකුල් පැටව් 710ක් එනම් සියයට 25 ක් මියගොස් තිබුණි. | අයහපත් කාලගුණය, ප්‍රතිලාභීන් ගේ නඩත්තු කිරීම්වල පැවැති පහසුකම්වල අඩුබව සහ වනසතුන්ගේ තර්ජන නිසා වැඩි මියයාමේ ප්‍රතිශතයකට මුහුණ දීමට සිදුවූ බව. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විධිමත් අධීක්ෂණයක්, මඟ පෙන්වීමක් හා පසු විපරම් කිරීම සඳහා සක්‍රීය වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය නිවාස පුනර්ජීවන වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ නිවාස 3,541කින් නිවාස 64ක් මේ දක්වා ප්‍රතිලාභීන් විසින් පදිංචිය සඳහා භාවිතයට නොගෙන තිබුණි. | අභාවිත නිවාස, පදිංචි කරවීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව ගනිමින් පවතින බව . | ව්‍යාපෘති යේ අරමුණු ඉටුකර ගැනීමට කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වවුනියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා ගම්මාන වැඩසටහන යටතේ ස්ථාපිත කළ පනීර් විකුණුම් මධ්‍යස්ථානය 2021 දෙසැම්බර් 27 දින සම්පූර්ණ කර මාස 05ක් යනතුරුත් මහජන භාවිතය සඳහා විවෘත කර නොතිබුණ අතර 2022 ජුනි 04 දින සිදුවූ බර වාහන අනතුරක් හේතුවෙන් මෙම මධ්‍යස්ථානයට හානි වී තිබුණි. | විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙනුත්, කොවිඩ් වසංගතය නිසා ප්‍රතිලාභීන් බලපෑමට ලක්වී තිබීම හේතුවෙනුත්, ඔබ විසින් සඳහන් කළ කාලවකවානු තුළ ප්‍රතිලාභීන්ගේ පරිහරණය සඳහා මෙම ගොඩනැගිල්ල භාරදිය නොහැකි වී තිබූ බව. | සුදුසු වැඩපිළිවෙලක් යොදා වත්කම මහජනතාවට භාවිතය සඳහා විවෘත කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව එකතුව රු.291,639,356ක පිරිවැයකින් ඉදිකර තිබූ වවුනියා ආර්ථික මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර නොතිබුණු අතර 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සහ ජල ගාස්තු සඳහා එකතුව රු.7,846,555ක් වැයකර තිබුණි. | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලැබූ වහාම භාවිතයට ගැනීමට පියවර ගනු ලබන බව. | විධිමත් වැඩපිළිවෙලක් යොදා වත්කම අදාල අරමුණ වෙනුවෙන් භාවිතා කිරීමට පියවර ගතයුතුය. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික නාගරික නිවාස ඉදිකිරීම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ කඩිනම් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ග්‍රාමීය සංවර්ධන සමිති 03කට ලබාදුන් එකතුව රු.162,576ක් වටිනා සෙවිලි තහඩු අදාල කොන්ත්‍රාත්කරු විසින් ආපසු රැගෙන ගොස් තිබුණ අතර, කොන්ත්‍රාත්කරු වෙත මුදල් නොගෙවීම නිසා රු.387,425 ක් වටිනා භාණ්ඩ අදාල සමිති වෙත ලබා නොදීමට කොන්ත්‍රාත්කරු කටයුතු කර තිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් කාල ප්‍රමාදයකින් ලැබීමෙන් ගෙවීම්වල සිදුවූ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් එම ග්‍රාමීය සංවර්ධන සමිතියට (RDS) ලබාදුන් සෙවිලි තහඩු ආපසු ලබාගෙන තිබූ අතර සංවර්ධන සමිතියට (RDS) පුටු ලබාදී නොතිබුණු බව. | ප්‍රතිපාදන හා අග්‍රිම මුදල් ලබා ගැනීම පිළිබඳ අවධානය යොමු කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය. |
| (ආ) | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පරන්නට්ටකල් පෙරපාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය රු.මිලියන 2 ක ඇස්තමේන්තුවක් යටතේ ප්‍රජා පාදන සංවිධානයකට කොන්ත්‍රාත්තුව ලබා දී එකතුව රු. 1,551,712ක් වැයකර තිබුණි. ඉදි කිරීම් කටයුතු 2019 දෙසැම්බර් 06 දින නිම කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදි කිරීම් සම්පූර්ණ කර නොතිබුණි. | අදාල වැඩසටහන රු.194,844,840ක ඇස්තමේන්තුගත පිරිවැයක් මත කොන්ත්‍රාත් අත්සන් කර තිබුණි. එසේ වුවත්, එම මූල්‍ය වර්ෂයේ අක්මුදල් නොලැබීමෙන් මෙම වැඩසටහන අත්සන් කළ දිනයේ අවසන් කළ නොහැකි වු බව. | - එම - |

## 3.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කළ වැසිකිළි ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාල එකතුව රු.280,000 ක ප්‍රතිපාදන සලසා තිබූ වැසිකිළි 4 ක් ඉදි කිරීම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිම කර නොතිබුණි. | එම වැසිකිලි 04හි කාර්යය කඩිනමින් නිමකිරිමට සහකාර සැලැසුම් අධ්‍යක්ෂ හා සංවර්ධන නිලධාරිට ප්‍රාදේශීය ලේකම් වරයා උපදෙස් ලබාදී ඇති බව. | නියමිත කාලය තුළ වැසිකිලි ඉදිකර අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ඌර්මිලාකෝට්ට පොදු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත් කාර්යය 2022 මාර්තු 07 දින වවුනියා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ග්‍රාමීය සංවර්ධන සමිතියක් සමග රු.1,800,000කට මාස 06කින් අවසන් කිරීමට ගිවිසුම්ගත වී තිබූ නමුත්, මෙම කාර්යයන් අවසන් නොකර අත්හැර දමා තිබුණි. | 2022.04.26 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, ආරම්භ කළ සියළු ව්‍යාපෘති නවතා දැමීමට සිදුකළ දැනුම්දීමට අනුව මෙම ව්‍යාපෘතිය අදාල කාලය තුළ අවසන් කළ නොහැකි වූ බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නිෂ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ වෙංගඩචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 16ක් පසුගිය මාස 03 සිට වර්ෂ 06කට අධික කාලයක සිට අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙංගඩචෙට්ටිකුලම් රජ සමූහ (චමරිය) නිවාසය භාවිතා කළ නොහැකි තත්ත්වයක පැවැතීම නිසා එය ඉවත් කරන ලෙසට 2024.04.15 දින ඉල්ලීමට අනුව ඉදිරි ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයාගේ වාර්තාවට අනුව ක්‍රියාමාර් ගනු ලබන බව. | භාවිතා කළ නොහැකි වත්කම් පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් යතුරුපැදි 08ක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු නොකර වර්ෂ 02 ක සිට වර්ෂ 07ක් දක්වා කාලයක් අනාරක්ෂිතව ගාල්කර තිබුණි. | අළුත්වැඩියා කර භාවිතා කළහැකි යතුරු පැදි භාවිතා කිරීමටත් ඉතිරි ඒවා චක්‍රලේඛ ප්‍රකාරව අපහරණයටත් කටයුතු කර ඇති බව | අළුත්වැඩියා හා නඩත්තු කටයුතු විධිමත්ව සිදු කර ඵලදායී ලෙස වාහන භාවිතයට පියවර ගත යුතුය. |

### 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක එකතුව රු. 13,285,369ක වියදමින් එළුවන් 525ක් ලබාදී තිබුණි. වවුනියා දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාදුන් එළුවන් 49 ක් විධිවිධාන ප්‍රකාරව රක්ෂණය කර නොතිබුණ අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක මියගිය රක්ෂණය කළ එළුවන් 44ක් සඳහා එක් එළුවෙකුට රු.2,935ක් බැගින් එකතුව රු.129,140ක රක්ෂණ වන්දි ආයතනය විසින් ප්‍රතිලාභීන්ට ලබාදී නොතිබුණි. | ලබාදුන් සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා එළුවන් මිලදී ගෙන ලබාදෙන ලෙසටත්, රක්ෂණ වියදම් ප්‍රතිලාභීන් විසින්ම දරා ගැනීමට එකඟවීමට අනුව මිලදී ගෙන බෙදාහරින ලදි. රක්ෂණය කළ අතරතුරදී රෝගාබාධවලට භාජනය වී මියගිය එළුවෙකු පිළිබඳ තොරතුරු අදාල පශුසම්පත් වෛද්‍යවරයාට නොදැන්වීමත්, වෛද්‍ය වාර්තා තහවුරු නොකිරීමත්, නිසා රක්ෂණ වන්දි ලබාදී නොමැති බව. | චක්‍රලේඛ කොන්දේසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු අතර රක්ෂණ මුදල් අදාල ආයතනයෙන් ප්‍රතිලාභීන්ට ලබාදීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බතික් විකුණුම් මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වී නොතිබුණ අතර, ඒ සඳහා දරා ඇති වියදම් පරීක්ෂාවේදී එකතුව රු.354,184ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය. | තාන්ඩිකුලම් බතික් විකුණුම් මධ්‍යස්ථානයේ ඔබ විසින් සඳහන් කළ වැඩසටහනේ කාර්යයන් 17 සහ 18 අවසන් වී ඇති අතර ඉතිරි කාර්යයන් කඩිනමින් අවසන් කරන බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පනීර් විකුණුම් මධ්‍යස්ථානයේ සවිකිරීම් කාර්යයන් අවසන් වී නොමැති අතර, ඊට අදාල වියදම් පරීක්ෂණයේදී එකතුව රු.91,824ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය. | රු.37,824ක් වටිනා wash basin 02ක් සොරකම් කර තිබූ අතර රු.54,000ක් වටිනා Display Board විවෘත කිරීමේ උත්සවයේ දී සවිකරන බවත් කොන්ත්‍රාත්කරු විසින් තහවුරු කර ඇති බව. | - එම - |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිවාස 04ක පදිංචි වී සිටි අයගෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු කුලී එකතුව රු.278,085ක් මාස එකේ සිට මාස 23කට අධික කාලයක් අයකර නොතිබුණි. | ලිපි සහ සිහිකැඳවීම් ලිපි කිහිපයක් යවා තිබූ නමුත් අදාල දෙපාර්තමේන්තු විසින් හිඟමුදල් යවා නොතිබුණි. | හිඟකුලී අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු යටතේ රජයේ බැංකුවක වවුනියා ශාඛාවට ලබා දී ඇති ඉඩමක් වෙනුවෙන් වර්ෂ 12ක් සඳහා ගෙවිය යුතු බදු වාරික හා දඩගාස්තු එකතුව රු.45,392,000ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | වවුනියා ලංකා බැංකුව විසින් 2012 ඔක්තෝබර් 05 දින බදු සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත් 2020 ඔක්තෝබර් 14 දින තක්සේරු වාර්තා ලැබී තිබුණි. බැංකු නිලධාරීන්ට කිහිප අවස්ථාවක් ලිපි යවා තිබූ නමුත් බදු මුදල් සහ දඩ ගාස්තු ගෙවා නොමැති බව. | බදුකුලී සහ දඩ ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |